

# කුරුඳු වගාකරුවන් සඳහා Ceylon Cinnamon Geographical Indication මාර්ගෝපදේශය

## පළමු කොටස

EDB SRI LANKA

Funded by the European Union

IFC International Finance Corporation WORLD BANK GROUP

Creating Markets, Creating Opportunities

# කුරුඳු වගාකරුවන් සඳහා CCGI මාර්ගෝපදේශය

## පළමු කොටස

---

2022 වන වසරේ පෙබරවාරි මාසයෙහි දී යුරෝපා සංගමයේ (EU) කොමිසම ශ්‍රී ලංකා කුරුඳු සඳහා GI තත්ත්ව සහතිකය ලබා දීමත් සමඟ අප රටට තම ප්‍රථම භූගෝලීය දර්ශක (GI) සහතිකය ලබා ගැනීමට අවස්ථාව ලැබුණි. මෙම ක්‍රියාවලිය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින්, යුරෝපා-ශ්‍රී ලංකා වෙළඳ ආශ්‍රිත ආධාර ව්‍යාපෘතියේ ද සහය ඇතිව සහ UNIDO, WTO සහ අනෙකුත් හවුල්කරුවන්ගේ තාක්ෂණික සහය ද ඇතිව, මෙහෙයවනු ලැබුණි.

GI තත්ත්ව සහතිකය ලබාගැනීමෙන් පසු, අගය උත්පාදනය සඳහා සහායවීම සහ ලාංකීය කුරුඳු අපනයනය කිරීම සඳහා GI සහතිකය ලබාගැනීමට පහසුකම් සැපයීම ඉතා වැදගත් වේ. මෙම කාර්‍යය සංදහා EU-ACIIS වැඩසටහන යටතේ ධාරිතා සංවර්ධන ක්‍රියාකාරකම් ගණනාවක් ක්‍රියාත්මක කිරීමට EDB ආයතනය, IFC ආයතනය සමඟ එකට එක්වී ඇත. මෙම පුහුණුවීම් අත්පොත ගන්නා ලද වැයමේ එක් කොටසකි. මෙම උත්සාහයේ කොටසක් ලෙස EDB විසින් Control Union සමඟ ගිවිසුම් ගතවුනු අතර, එමඟින් මෙම අත්පොත සැකසීම සඳහා අවශ්‍ය කරන ලැබූ කරුණු ලබා ගැනීම සිදු වුණි.

පටුන


| | | |
|---|---|---|
| **1** | **ලියාපදිංචි කිරීම** ............................................................................................ | 2 |
| **2** | **නිශ්පාදනයේ විශේෂ අවස්ථා**.............................................................................. | 2 |
| **3** | අස්වනු හා පසු අස්වනු සකස් කිරීම ........................................................................ | 7 |
| **4** | අමුද්‍රව්‍ය ප්‍රවාහනය .............................................................................................. | 8 |
| **5** | වගා භූමිය තුළදී වාර්ථා තබා ගැනීම ......................................................................... | 8 |


සටහන්


| | | |
|---|---|---|
| **1** | පොලිතීන් වලින් ආවරණය කරන ලද තවාන්..................................................... | **3** |
| **2** | ශාක වල පෝෂණ ඌණතා ලක්ෂණ ............................................................................ | **4** |
| **3** | පරිණත අතු කැපූ පසු මතුවූ මොරෙයියන් ................................................................. | 6 |
| **4** | අස්වැන්න නෙලා ගන්නා උස...................................................................................... | **7** |
| **5** | කැබලි කරන ලද පරිණත කඳ ...................................................................................... | **7** |
| 6 | අපරිණත මොරෙයියන් පැරණි ස්කන්ධයන්ට ගැට ගසා ඇති අයුරු ............................. | **8** |

| | පාලනය කරන සාධකය | අනුකූල නිර්ණායක | අමතර කරුණු |
|---|---|---|---|
| 1 | **ලියාපදිංචි කිරීම** | | |
| 1.1 | GI සාමාජිකයන්, සමාගමේ ලියාපදිංචි වී සිටීද? | සෑම සමාගමක්ම හෝ තනි සාමාජිකයෙකුම, දිස්ත්‍රික් මට්ටමෙන් ලියාපදිංචි වී ඇති වගාකරුවන් පිළිබඳ පහත දක්වා ඇති තොරතුරු වාර්ථා කර ගත යුතුය.<br>- නම<br>- සාමාජික හැඳුනුම්පත් අංකය<br>- වගාව පිහිටි ස්ථානය සහ භූමි ප්‍රමාණය | |

| **2** | **නිශ්පාදනයේ විශේෂ අවස්ථා** | | |
|---|---|---|---|
| 2.1 | ප්‍රචාරණය | | |
| 2.1.1 | ගොවීන් විසින් වගාවට අවශ්‍ය ද්‍රව්‍ය තමන් විසින්ම සපයා ගන්නවාද? | ඔවි නම් හිතකර ලක්ෂණ සහිත ප්‍රවේණි දර්ශ ලබා ගැනීමේදී උසස් ලක්ෂණ සහිත මව් ශාක තෝරා ගත යුතුය. එසේ නොමැති නම් ප්‍රභවය වන මව් ශාකය පිළිබඳ ප්‍රමාණවත් කරම් තොරතුරු ලබා ගත යුතුය. ලබා ගන්නා ප්‍රමාණය ඇතුලත් ලිපි ලේඛණ ද තිබිය යුතුය. | ලංකාවේ කුරුඳු විශේෂ කිහිපයක් ඇත. නමුත් වාණිජව වගා කරන්නේ *Cinnamomum zeylanicum Blume* පමණි. |
| 2.1.2 | යොදාගන්නා බීජ හෝ ප්‍රචාරණ ද්‍රව්‍ය නිසි ක්‍රමවේදයන්ට අනුව සකස් කරනවාද? | පැළ නිපදවීම සඳහා යොදා ගන්නා කුරුඳු බීජ තෝරා ගැනීමේදී හොඳින් ඉදී දම් පැහැයට හැරුණු බීජ නෙලා ගත යුතුය. (වසරකට වරක් මැයි සිට ජුලි අග දක්වා)එම බීජ ඵලාවරණය මෘදු වන තෙක් දිනක් හෝ දෙකක් සෙවණ සහිත පිරිසිදු ස්ථානයක ගොඩ ගසා තිබිය යුතුය. ඉන් පසු ඵලාවරණය ඉවත් කිරී මට හොඳින් අතුල්ලා ගලා යන ජලයෙන් සේදිය යුතුය. මෙම බීජ තවාන් දමා හෝ සකස් කරන ලද බිමෙහි වගා කිරීමට ගත හැකිය. | මහා පරිමාණයෙන් කුරුඳු ප්‍රචාරණය කිරීම සිදු කරන්නේ බීජ මගිනි. කැපූ කඳන් මගින් වර්ධක ප්‍රචාරණය වුවද සිදුකළ හැකිය. පළමුව තෝරාගත් හොඳින් ඉදුණු බීජ ඵලාවරණය ඉවත් වන තෙක් හොඳින් සෝදා ගත යුතුය. ඉන් පසු 12.5 x 20.0cm වූ මලු වලට මතුපිට පස්, ගොම, වැලි සහ කොහු බත් සමාන ප්‍රමාණ වලින් දැමූ මාධ්‍යයක බීජ සිටුවීම කළ යුතුය. එක් මල්ලක බීජ 5ත් 8ත් අතර ප්‍රමාණයක් සිටුවිය යුතුය. (මූලාශ්‍ර- කුරුඳු වගාව සහ අස්වනු සැකසීම, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,5 වෙළුම) |



1: පැල තවාන්

| | | | |
|---|---|---|---|
| 2.2 | **භූගෝලීය සහ දේශගුණික සාධක** | | |
| 2.2.1 | භූමියේ වගාවට සුදුසු පසක් තිබෙනවාද? | <u>*Cinnamomum zeylanicum*</u> බෝගය වගා කරනු ලබන්නේ ගැඹුරු, හොඳින් ජලය උරා ගන්නා තෙත් බවින් යුතු පසෙහිය.<br>වඩාත් සුදුසු වන්නේ වැලි මිශ්‍ර, බොරළු, මැටි සහ රොන් මඩ සහිත පස් වේ. කෙසේ වෙතත් කිසිදු සංඝටකයක් 50% නොඉක්මවිය යුතුය. | කුරුඳු පැළ වර්ධනය වන පසෙහි ස්වභාවය ඇමුණුම I හි පරිදි වෙනස් විය හැකිය. (ලංකාවේ පස් ආකෘතිය, Agricultural Research for Sustainable Food Systems in Sri Lanka Soil Survey, Classification and Mapping in Sri Lanka) |
| 2.2.2 | තෝරාගත් ප්‍රදේශයේ වගාවට හිතකර භූගෝලීය සහ දේශගුණික සාධක පවතීද? | කුරුඳු වගාව සඳහා සුදුසු වන්නේ මුහුදු මට්ටමේ සිට උස මීටර 10ත් 700ත් අතර බිමකි. වගා කටයුතු සඳහා වැඩි ජල ප්‍රමාණයක් අවශ්‍ය වන අතර ආර්ද්‍රතාවය වැඩි වීමද වගාවට හිතකර සාධක වේ. එමෙන්නම වාර්ශික වර්ෂාපතනය 1250 mm ත් 3500 mm අතර පවතින ප්‍රදේශ කුරුඳු වගාවට වඩාත් යෝග්‍ය වේ. | ශ්‍රී ලංකාවේ කුරුඳු වල සම්භවය මධ්‍ය කඳුකරයේ යැයි සැළකෙන අකර හඳුනාගත් වල් දර්ශ 7ක් මහනුවර, මාතලේ, බෙලිහුල් ඔය, හපුතලේ, හෝර්ටන් තැන්න හා සිංහරාජය යන ස්ථාන වල පවතී. මේ වන විට වගාවන් බහුලව පවතින්නේ මීගමුව සිට මාතර දක්වා වන වෙරළබඩ තීරයේ සහ කළුතර සිට රත්නපුර දක්වා වූ ප්‍රදේශ වලය. (මූලාශ්‍ර- කුරුඳු වගාව සහ අස්වනු සැකසීම, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 5 වෙළුම, ඇමිණුම II - උන්නතාංශ හා වර්ෂාපතන සිතියම්, කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව) |

| | | | |
|---|---|---|---|
| 2.3 | පසේ සාරවත් බව සහ බෝග මනා පාලනය | | |
| 2.3.1 | නිශ්පාදකයා පසෙහි සාරවත් බව නිසි ලෙස පවත්වා ගෙන යනවාද?/ පසෙහි සරු බව වැඩි දියුණු කරනවාද? | පාංශු විශ්ලේෂණ වාර්තාව (N, P, K විශ්ලේෂණය මත) හෝ හඳුනාගෙන ඇති පොදු ශාක පෝෂණ ඌණතා සහ පෝෂක ද්‍රව්‍ය විෂ වීම් පිළිබඳ ලක්ෂණ සැලකිල්ලට ගත යුතුය. | ඇමිණුම 3- (වාර්ෂිකව ඉවත් වන පෝෂක වර්ග, කුරුඳු වගාව සහ අස්වනු සැකසීම, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 5 වෙළුම)<br>ඇමිණුම 5- සාමාන්‍ය ඌනතා රෝග ලක්ෂණ කුරුඳු පත්‍රයේ දක්නට ලැබෙන |
| 2.3.4 | නිශ්පාදකයා විසින් රසායනික පොහොර භාවිතා කරනවාද? ඔව් නම් යොදා ගන්නා නිර්දේශ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික ප්‍රකාශිත පාංශු පෝෂක ද්‍රව්‍ය විශ්ලේෂණ ප්‍රතිඵල වලට අනුකූලව පවතීද? | <u>*Cinnamomum zeylanicum*</u> බෝගය සඳහා වඩාත් සුදුසු pH අගය 5.5 ත් 6.5ත් අතර වේ. පොහොර භාවිතා කරන ආකාරය අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ නිර්දේශයන්ට අනුකූල විය යුතුය. | පැළ සිටුවනු ලබන වල මතුපිට පස් යොදා පිරවිය යුතුය.<br><u>*Cinnamomum zeylanicum*</u> බෝගය සඳහා වඩාත් සුදුසු pH අගය 5.5 ත් 6.5ත් අතර වේ. pH අගය අඩු වූ විට (ගසෙහි කොළ හෝ අනෙකුත් කාබනික ද්‍රව්‍ය උපස්ථරය මත වැටීම නිසා pH අගය අඩු විය හැකිය) pH අගය වැඩි කර නිසි මට්ටමට ගැනීම සඳහා ඩොලමයිට් යොදනු ලැබේ. (1000kg/ha/yr)<br>ඇමිණුම IV- පොහොර යෙදිය යුතු නිර්දේශිත ප්‍රමාණ කුරුඳු වගාව සහ අස්වනු සැකසීම, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 5 වෙළුම) |
| 2.3.5 | නිශ්පාදකයා විසින් ශාක අතර නිසි පරතරයක් හා පැළ සිටුවීමෙ රටාවක් පවත්වා ගෙන යනවාද? | පැළ සිටුවීමෙදී පේළි අතර පරතරය අඩි 4ක්ද පේළිය තුළ පැල දෙකක් අතර පරතරය අඩි 3ක්ද වන ලෙස පවත්වා ගත යුතුය.<br>පේළි සකස් කළ යුත්තේ එකිනෙකට සමාන්තර වන ලෙස හෝ සිග් සැග් ආකාරයට වේ. | බීජ හෝ කුඩා පැළ 3-15 අතර ප්‍රමාණයක් එක ළඟ සිටුවීම මගින් පඳුරු ලබා ගත හැකිය. මෙම පඳුරු සිටුවනු ලබන්නේ පේළි අතර පරතරය අඩි 4ක්ද පේළිය තුළ පඳුරු දෙකක් අතර පරතරය අඩි තුනක්ද වන ලෙසයි.<br>පස සෝදා යාම අවම කිරීම සඳහා භූමිය තැනිතලා වූ විට පේළි සකස් කිරීම එකිනෙකට සමාන්කරව සහ භූමිය බෑවුම් සහිත වූ විට සිග් සැග් ආකාරයට පේළි සකස් කිරීම සිදු කරයි. |
| 2.3.6 | නිශ්පාදකයා විසින් නිසි වේලාවට කප්පාදු කිරීම් සිදු කරනවාද? | ළපටි පැළ- පැළ සිටුවීමෙන් අවුරුදු එක හමාරක් හෝ දෙකකට පසු පළමු කප්පාදු කිරීම සිදු කරයි. මෙහිදී පඳුරේ උසින් භාගයක් පමණ වන තෙක් ඇති සියළු කොළ සහ අතු ඉවත් කිරීම සිදු කරයි. මේ ආකාරයටම දෙවන කප්පාදු කිරීම අවුරුදු දෙක හමාරකට පසු සිදු කරයි. | තෝරාගත් අවස්ථා කිහිපයකදීම කප්පාදු කිරීම සිදු කරයි.<br>පැළ සිටුවීමෙන් අවුරුදු එක හමාරක් හෝ දෙකකට පසු පළමු කප්පාදු කිරීම සිදු කරයි. මෙහිදී පඳුරේ උසින් භාගයක් පමණ වන තෙක් ඇති සියළු කොළ සහ අතු ඉවත් කිරීම සිදු කරයි.<br>මේ ආකාරයටම දෙවන කප්පාදු කිරීම අවුරුදු දෙක හමාරකට පසු සිදු කරයි.<br>මෙම ක්‍රියාවලිය සෑම අස්වැන්න |

| | | | |
|---|---|---|---|
| 2.5 | | | නෙලීමකටම මාස තුනකට පෙර සිදු කරයි. එහිදී අනවශ්‍ය කොටස්, රෝගී වූ කොටස් හා හානි වූ කොටස් සියල්ල ඉවත් කරනු ලබයි.<br>සෑම අස්වැන්න ගැනීමකට පසුවම නව මොරෙයියන්ගේ මතු වීම සිදු වේ. ඒවා අතරින් ශක්තිමත්ම සහ කෙලින් වැඩුනු ඒවා පමණක් ඉතිරි වේ.මෝරන ලද අතු කැබලි කිරීම එකම අවස්ථාවේ සිදු කිරීම අවශ්‍ය නොවන අතර විටින් විට සිදු කළ හැකිය. මේ මගින් ළපටි මොරෙයියන් හා සම්බන්ධ වීමට පරිණත අතු ඉතිරි වේ. ළපටි මොරෙයියන්ගේ කෙලින් බව නැති වී නැමීම වලක්වා ගැනීමට පරිණත අතු වලට තබා ගැට ගැසීම සිදු කරයි. |





3: පරිණත අතු කැපූ පසු මතුවූ මොරෙයියන්

| | | | |
|---|---|---|---|
| 2.5 | රෝග, වල් පැළෑටි සහ පළිබෝධ මනා පාලනය | | |
| 2.5.1 | නිශ්පාදකයා විසින් රෝග, වල් පැළෑටි සහ පළිබෝධ කළමණාකරණය සඳහා විධි විදාන යොදනවාද? | රෝග, වල් පැළෑටි සහ පළිබෝධ පාලනය සඳහා මෙහි දක්වා ඇති ක්‍රම යොදා ගත හැකිය.<br>උපකරණ යොදාගෙන හෝ අතින් සිදුකරන යාන්ත්‍රික ක්‍රමය<br>රසායනික ද්‍රව්‍ය යෙදීම<br>බෝග මාරුව, අන්තර් බෝග හා මිශ්‍ර බෝග වගාව<br>රෝග වලට ඔරොත්තු දෙන විශේෂ තෝරා ගැනීම<br>තාපය භාවිතය සහ<br>පළිබෝධකයන්ගේ ස්වාභාවික සතුරන් යොදා ගැනීම(බඩවැටිය, කූඩු සෑදීම, විලෝපිකයන් නිදහස් කිරීම) | පොල් සහ කුරුඳු මිශ්‍ර වගාවක් ලෙස කිරීම සුදුසු වේ. මෙහිදී වගාවන් දෙකටම අවශ්‍ය පහසුකම් නිසි පරිදි සැපයීම වැදගත් වේ.<br>කුරුඳු වගාව සඳහා යොදා ගන්නා භූමිය මීට පෙර රබර් වගාව සිදු කල භූමියක් නොවිය යුතුය. |
| 2.5.2 | නිශ්පාදකයා විසින් රසායනික ද්‍රව්‍යයක් | රෝග, වල් පැළෑටි සහ පළිබෝධ කළමණාකරණය සඳහා යොදා | ඇමිණුම v (නිර්දේශිත |

| | | | |
|---|---|---|---|
| | යොදා ගන්නේ නම් ඔහු විසින් යොදා ගන්නේ රෝග, වල් පැළෑටි සහ පළිබෝධ කළමණාකරණය සඳහා අවසර ලත් නිශ්පාදනයක් ද? | ගන්නා රසායනික ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ භාවිතයට අවසර ඇති ලේඛණයේ අඩංගු විය යුතුය (නිර්දේශිත පළිබෝධනාශක ලේඛණය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය, 2019) | පළිබෝධනාශක ලේඛණය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය, 2019)<br>ඇමිණුම 6 (ලංකාවේ තහනම් කරන ලද සහ සීමා කරන ලද පළිබෝධනාශක ලැයිස්තුව) |

| | | | |
|---|---|---|---|
| 3 | අස්වනු හා පසු අස්වනු සකස් කිරීම | | |
| 3.1 | නිශ්පාදකයා සතුව කුරුඳු පොතු ඉවත් කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් තරම් සුදුසුකම් පවතීද? | සෑම අයෙකු සතුවම කුරුඳු පර්යේෂණ ආයතනය මගින් නිකුත් කරන ලද පිළිගත් සහතිකයක් තිබිය යුතුය. (tvec) | අස්වැන්න නෙලීමේ කිරීමේ ක්‍රියාවලිය මෙන්ම කුරුඳු කෝටු සකස් කිරීමේ ක්‍රියාවලිය සිදු කළ යුත්තේ හොඳින් පුහුණු වූ අයෙකු විසිනි. |
| 3.2 | නිශ්පාදකයා විසින් අස්වැන්න එකතු කිරීමේ යන්ත්‍ර භාවිතය පිළිබඳ නිසි ක්‍රමෝපායන් යොදා ගන්නවාද? | අස්වැන්න එකතු කිරීමට පෙර යොදා ගන්නා උපකරණ හොඳින් සූදානම් කර ගත යුතුය. පොතු ඉවත් කිරීමට ගන්නා උපකරණ හොඳින් මුවහත් කර පිරිසිදු ජලයෙන් සෝදා ගත යුතුය.<br>අස්වැන්න ලබා ගැනීමට පෙර කප්පාදු කිරීමක් සිදු කරනු ලබයි. | |
| 3.3 | නිශ්පාදකයා විසින් නිවැරදි අස්වැන්න ලබා ගැනීමේ ක්‍රියාමාර්ගයන් සිදු කරනවාද? | පරිණතම රිකිල්ල බිම් මට්ටමේ සිට අඟල් දෙකක් (සෙ.මී 6ක්) උසින් කපනු ලබයි.<br>කැපීම සිදු කරන්නේ පඳුර ඇතුල් දෙසට අංශක 45ක් ආනතියක් සහිතව තියුණු කැපුමක් යෙදීමෙනි. | පරිණතම රිකිල්ල බිම් මට්ටමේ සිට අඟල් දෙකක් (සෙ.මී 6ක්) උසින් කපනු ලබයි.<br>කැපීම සිදු කරන්නේ පඳුර ඇතුල් දෙසට අංශක 45ක් ආනතියක් සහිතව තියුණු කැපුමක් යෙදීමෙනි.<br>එකවර සියළුම කුරුඳු කඳන් නෙලා ගැනීම සිදු නොකළ යුතු අතර හොඳින් වර්ධනය වූ කුරුඳු කඳන් එකක් හෝ දෙකක් එම පඳුර තුළ ඉතිරි කළ යුතුය. |



4: අස්වැන්න නෙලා ගන්නා



5 : කැබලි කරන ලද පරිණත කඳ

| | | | |
|---|---|---|---|
| 3.4 | නිශ්පාදකයා විසින් අස්වැන්න ලබා ගත් පසු පඳුරු නඩත්තු කිරීමේ කටයුතු නිසි පරිදි සිදු කරනවාද? | | |





6. අපරිණත මොරෙයියන් පැරණි ස්කන්ධයන්ට ගැට ගසා ඇති අයුරු

| | | | |
|---|---|---|---|
| 4 | අමුද්‍රව්‍ය ප්‍රවාහනය | | |
| 4.1 | නිශ්පාදකයා විසින් ගැළපෙන ප්‍රවාහන පහසුකම් යොදා ගන්නවාද? | එකතු කරගත් කුරුඳු කඳන් සහ පත්‍ර සකස් කිරීමේ මධ්‍යස්ථාන වලට පැය 24ක් ඇතුළත ප්‍රවාහනය කළ යුතුය. | ප්‍රවාහනය කරනු ලබන නිශ්පාදන නිසි පරිදි ඇසුරුම් කර බහාලුම් තුළ දමා හානි වීමකින් තොරව රැගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| 5 | වගා භූමිය තුළදී වාර්ථා තබා ගැනීම | | |
| 5.1 | ගබඩා සහ මූල්‍ය වාර්ථා අදාල ඒකක තුළ පවත්වා ගෙන යනවාද? | ගබඩා පිළිබඳව සහ වැඩ කිරීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ වාර්ථා ක්ෂේත්‍ර මට්ටමෙන් අවම අවුරුදු දෙකක්වත් පවත්වා ගත යුතුය. | ඇමිණුම VII (ප්‍රචාරණ ද්‍රව්‍ය පිළිබඳ වාර්ථා සටහන්, පළිබෝධ පාලන වාර්ථා, අස්වැන්න ලබා ගැනීම පිළිබඳ වාර්ථා සහ යවන ලද භාණ්ඩ පිළිබඳ වාර්ථා) |

සැකසීම ගොවි මට්ටමින් සිදු වන්නේ නම්, සැකසුම් අංශය සඳහා මාර්ගෝපදේශ අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.